# ගන්දරපුරාණ විහාර බිතුසිතුවම්හි හායන කාරක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.එම්.සී.ඊ.මානවසිංහ[1], පී.ජී.ඩී.වයි. දිල්රුක්ෂි[2], ඩබ්.ජී.එම්. දුලාංජලී[3],ඩී.එම්.එස්.එල්.චන්ද්‍රරත්න[4]

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
[1]chamodii1992@gmail.com,[2]damishagamage@gmail.com, [3]madugamage@gmail.com

ප්‍රමුඛ පදඃ හායනකාරක, මූලධර්ම, සිතුවම්, සංරක්ෂණය, ද්‍රව්‍ය සම්පින්ඩනය

## හැඳින්වීම

ප්‍රාග් ඓතිහාසික යුගයේ දී ගල්ගුහා පියසි ආශ්‍රිතව ඇරඹි සිතුවම් කලාව මහින්දාගමනය හේතුවෙන් අනුරාධපුර, පොළොන්නරු යුගවල දී සම්භාව්‍යත්වයට පත්විය. 13-17 සියවස්හි ද එකී සම්භාව්‍යත්වය බිඳ වැටුණ ද 17, 18 සියවස්වල දී මහනුවර යුගයේ නැවතත් සුවිශේෂී සිතුවම් සම්ප්‍රදායක් ගොඩනැගුණි. මහනුවර සමයේ උඩරට පැවති විහාර බිතුසිතුවම් සම්ප්‍රදායට සමගාමීව වර්ණයෙන්, ශෛලියෙන් හා ද්‍රව්‍ය සම්පිණ්ඩනයෙන් ඊට වෙනස්කම් දක්වන සිතුවම් සම්ප්‍රදායක් පහතරට ප්‍රදේශයේ පැතිර ගියේ ය. කෝට්ටේ යුගයේ පැවති කලාව ක්‍රමයෙන් දෙපසකට විහිදී ගොස් ඉන් එක් කොටසකින් මහනුවර කලාව ද, අනෙක් කොටසින් පහතරට විශේෂයෙන් දකුණු පළාතේ සිතුවම් කලාව ද ඇති වූ බව විශ්වාස කෙරේ. මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායට අයත් සිතුවම් සහිත ස්ථාන රාශියක් දකුණු පළාත ආශ්‍රිතව හඳුනාගත හැකිය. මුල්ගිරිගල විහාරය, දොඩන්දූව ශෛලබිම්බාරාමය, කතළුව පූර්වාරාමය, කුමාරකන්ද විහාරය, කොටිකාගොඩ පුරාණ විහාරය, ගන්දර පුරාණ විහාරය ආදී ස්ථාන ඒ අතර වේ.මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ගන්දර නැගෙනහිර ග්‍රාමසේවා වසමෙහි පිහිටා ඇති ගන්දර පුරාණ විහාරය සුවිශේෂී සිතුවම් සහිත විහාරයකි. යටත්විජිත සමයේ මෙරට ජන සමාජයට එල්ල වූ බලපෑම එම සිතුවම් මඟින් විශද වීම සුවිශේෂී ලක්ෂණයකි. මැටි බදාමයට අමතරව හුණු බදාමය මෙන් ම වැලි, මැටි බදාමයට හුණු එකතු කරන ලද ලන්දේසි බදාමය භාවිත කිරීම, සම්ප්‍රදායික වර්ණවලට අමතරව යටත්විජිත සමයේ ගෙන්වන ලද විදේශීය වර්ණ භාවිතය, සිතුවම් මත වලිච්චි ආලේපනය ආදී තාක්ෂණික ක්‍රමවේද මෙම සිතුවම් නිර්මාණය සඳහා යොදා ගැනීම වර්තමානය දක්වා සිතුවම් ආරක්ෂා වීමට හේතු වී ඇත. නමුත් වර්තමානය වනවිට මෙම අනර්ඝ සිතුවම් විවිධ හේතු නිසා විනාශ වීමේ තර්ජනයට ගොදුරු වී ඇත. එබැවින් ඓතිහාසික ගන්දර විහාරයේ සිතුවම් හායනයට බලපාන ප්‍රධාන ගැටළු මොනවා ද යන්නඅධ්‍යයනය මෙම පර්යේෂණයේ ගැටළුව වේ.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී දත්ත හා තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් ම අවධානය යොමු කරනු ලැබුවේ ක්ෂේත්‍ර අධ්‍යයන කෙරෙහි ය. පිළිම ගෙය තුළ ඇති සිතුවම් හොඳින් අධ්‍යයනය කර විහාරාධිපති ස්වාමීන් වහන්සේ ඇතුළු විහාරස්ථාන ප්‍රජාවගෙන් ද, සිතුවම් සංරක්ෂකයන් හා සංරක්ෂණ නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා මඟින් දත්ත හා තොරතුරු ලබා ගන්නා ලදී. ක්ෂේත්‍රයේ දී

හඳුනාගත් තොරතුරු සනාථ කර ගැනීම සඳහා ලිඛිත මූලාශ්‍රය ද උපයෝගී කර ගැණුනි.

### ප්‍රතිඵල

උඩරට සම්ප්‍රදායේ සිතුවම්වල දක්නට ලැබෙන ආවේණික වර්ණ, හැඩතල, ලක්ෂණ මෙන් ම යුරෝපීය අභාසය මෙම සිතුවම්වල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයකි. ගන්දර පුරාණ විහාර පිළිමගෙයි ඇතුලු මාලයේ ඇතුලු බිත්තියේ හා පිටත බිත්තියේ ද, මැද මාලයේ ඇතුලු බිත්තියේ ද වශයෙන් බිත්ති තුනක සිතුවම් නිරූපණය කර ඇත. බිත්තිය සුදු හුණු බදාමයෙන් සකස් කර සිතුවම් ඇඳ ඇති අතර ත්‍රිමාණ ලක්ෂණ පෙන්වීමට උත්සාහ කර ඇත. මෙම ඓතිහාසික සිතුවම් විවිධ හේතුකාරක නිසා හායනයට පත් ව ඇති අතර එය ප්‍රධාන ආකාර දෙකක් යටතේ හඳුනාගත හැකිය.

### බාහිර හේතු

මෙම සිතුවම් හායනය වීමට බලපාන බාහිර හේතු ගණනාවක් හඳුනාගත හැකිය. පිළිමගෙය අවට වතුර රැස් වී ක්‍රමවත්ව ගලා නොයෑම නිසාවෙන් ඒ අවට භූමිය නිරන්තරව ම තෙත්වීම හේතුවෙන් ඇතිවන ලවන බලපෑම ඔස්සේ බිතුසිතුවම්වල පතුරු ගැලවීම හා කුඩු වශයෙන් ඉවත් වීම දැකගත හැකිය. පිළිමගෙය ඇතුළත පහන් හා හඳුන්කූරු දැල්වීම ද, පිළිමගෙය ඇතුළත වම්පස ඇති දේවාලයෙහි කපූරු දැල්වීම ද, පොහොය දිනවල බැතිමතුන් වැඩි ප්‍රමාණයක් ගැවසීම හා සිතුවම්වලට පිට දී සිටීම මෙන් ම සිතුවම් සංරක්ෂණය කිරීම උදෙසා යෝග්‍ය නොවන සංරක්ෂණ මූලධර්ම අනුගමනය කිරීම හා නුපුහුණු ශිල්පීන් ඒ සඳහා යෙදවීම යනා දී කරුණු සිතුවම් හායනයට බලපා ඇති ප්‍රධාන ගැටළු ලෙස හඳුනාගත හැකිය.

### අභ්‍යන්තර හේතු

සිතුවම් බිත්ති මත කෘමීන් විසින් ගුල් හාරා ඇති ආකාරය දැකගත හැකි අතර සිතුවම් නිර්මාණකරණයේ දී බන්ධන මාධ්‍යය ලෙස භාවිත කර ඇති කැඳ වර්ග, බිත්තර සාරු ආදිය කෘමීන්ගේ ආකර්ශනයට නතු වීම ඊට හේතුව යි. එසේම සිතුවම් සංරක්ෂණයේ දී නවීන රසායනික ද්‍රව්‍ය හා තීන්තත වර්ග භාවිත කිරීම හේතුවෙන් සිතුවම් අභ්‍යන්තරයට හානි වී පතුරු ගැලවී යාම ද සිදු වේ.

### සමාලෝචනය

මානවයාගේ සංස්කෘතික පරිණාමය සිදු වූ ආකාරය හඳුනාගත හැකි සුවිශේෂී අංශයක් ලෙස සිතුවම් හැඳින්විය හැකිය. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට මහනුවර යුගයේ අවසාන කාල පරිච්ඡේදය දක්වා කාල පරාසයට අයත් සිතුවම් මෙරට පැරණිත ම සිතුවම් ගණයට අයත් වේ. මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායට අයත් පරැණි සිතුවම් සහිත විහාරස්ථාන රාශියක් දකුණු පළාතේ පිහිටා ඇති අතර මාතර ගන්දර පුරාණ විහාරය ද ඉන් එක් සුවිශේෂී විහාරයකි. පහතරට සම්ප්‍රදායේ සුවිශේෂතාවන් මැනවින් උද්දීපනය කරනු ලබන මෙම විහාරයේ සිතුවම් මගින් එම කාලවකවානුවට සමකාලීන සමාජ, ආර්ථික, දේශපාලනික කරුණු අනාවරණය වේ. නමුත් එකී සිතුවම් කාලයාගේ ඇවෑමෙන් හා විවිධ හායනකාරක හේතුවෙන් විනාශ වෙමින් පවතී. ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් නිසාවෙන් සිතුවම්වලට මුහුණ පෑමට සිදුවන ගැටළු බාහිර හේතු වශයෙන් හඳුනාගත හැකිය. සිතුවම් ඇඳීමට භාවිත කරන ලද තාක්ෂණයේ යම් යම් වෙනස්කම් නිසාවෙන් සිතුවම් අභ්‍යන්තරයට සිදුවන හානි අභ්‍යන්තර හේතු වශයෙන් හඳුනාගත හැකිය.

ගන්දර පුරාණ විහාරයේ සිතුවම් හායනය කෙරෙහි පිළිමගෙය අවට භූමිය නිරන්තර

තෙතමනයෙන් යුක්ත වීම, වහලය හා සිවිලිම දිරාපත් ව අබලන් වීම, බදාම ස්තර පිපිරීම, බොල් වීම, ලවණ බලපෑමෙන් සිතුවම් පතුරු ගැලවීම මෙන් ම බැතිමතුන්ගේ ක්‍රියාකාරකම් හා වැරදි සංරක්ෂණ මූලධර්ම අනුගමනය කිරීම ආදී බාහිර ගැටළු ප්‍රධාන වශයෙන් ම බලපෑම් කරන ලද බව පැහැදිළි ව හඳුනාගත හැකිය.

ඊට අමතරව බිතුසිතුවම් සංරක්ෂණය සඳහා විශාල මුදලක් වැය වීම හා ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම මෙන් ම පුහුණු රසායනික සංරක්ෂණ ශිල්පීන්ගේ හිඟය ද විහාරස්ථාන ප්‍රජාවගේ නොසැලකිල්ල ද ප්‍රධාන ගැටළු වශයෙන් හඳුනාගත හැකි ය. යටත්විජිත සමයේ දකුණු පළාතේ පැවති සමකාලීන සමාජ රටාවේ සුවිශේෂීතා පෙන්නුම් කරනු ලබන ගන්දර පුරාණ විහාර ගෙය හි සිතුවම් විනාශ වීම වලක්වා අනාගතය උදෙසා රැක ගැනීම කාලීන අවශ්‍යතාවයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


මහින්ද හිමි, උණුවතුරබුබුලේ. (2007)*දකුණේ විහාරවල මහනුවර සම්ප්‍රදායේ චිත්‍ර*.කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

රීඩර, යොසොෆ්. (1991)*ප්‍රකෘතිකරණය හා සංරක්ෂණය.* කොළඹ: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

වගාච්චි, ඩයස්., ධර්මසිරි මිත්‍රානන්ද. (2003)*කැළණිය රජමහා විහාරය බිතුසිතුවම් සංරක්ෂණය.* මධ්‍යම සංස්කෘතික අරමුදල.

විජේපාල, ඩබ්.එච්., ගමගේ ටී.පී.එස්.ඒ. (2015)*රෝහණ උද්‍යානය.* මධ්‍යම සංස්කෘතික අරමුදල: සංස්කෘතික කටයුතු අමාත්‍යංශය.

දිසානායක , ඊ.එම්. (2016)*ගන්දර පුරාණ විහාරය රසායන සංරක්ෂණ වාර්තාව.* මාතර ව්‍යාපෘති කාර්යාලය: මධ්‍යම සංස්කෘතික අරමුදල.